# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,867 — 1969 අගෝස්තු 15 වැනි සිකුරාද — 1969.8.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස–අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් | 103 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් | — | නොතාරිස් ලැයිස්තුව | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් | — | විවිධ දැන්වීම් | — |
| ෆිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම | — | | |


## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### දකුණු පළාත

#### බදුල්ල දිස්ත්‍රික් නඩුශාලාවේදීය

කොස්ලන්දේ පකුසුදැස් ලිමිටඩ් ............................ පැමිණිලිකාරයා.

නොම්මරය : ඇ.මි. 2,753

එදිරිව

අම්පාරේ විදුලිබල මධ්‍යස්ථානයේ නිකපොත සිට නැසීගිය කේ. ඒ. ඇලෙක්සැන්ඩර්ගේ බූදලේ බලකාර කේ. ඒ. කරෝලිස් අප්පුහාමි ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රු. 5,000 සහ 62.5.5 සිට නීති පොලියද නඩු ගාස්තු රු. 605.30 ක් ද අයකර ගැනීම පිණිස වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 27 දින සවස 1.30 ට පටන් ගෙන එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කේ, වැලිගම් කෝරලේ, කොහුණුගමුවේ පිහිටි අඹගහ වත්ත නමැති ඉඩමේ බෙදුවෙන් කරන ලද උතුරට : එම ඉඩමේ " ඒ " අක්ෂරය, නැගෙනහිරට : කොහුණුකුඹුර, දකුණට : අඹගහකුඹුර, බස්නාහිරට : අඹගහකොරටුව සහ පතිරණ හේන යන මායිම් තුළ අක්කර 1, රූඩ් 0, පර්චස් 29 ක් විශාල " බී " අක්ෂරය දරණ කැබැල්ලෙන් නොබෙදූ 1/10 පංගුව මාතර, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 443/40 යටතේ ලියාපදිංචි කර තිබේ.

2. ඉහත කී කොහුණුගමුවේ පිහිටි උතුරට : අඹගහ පතිරණගෙහේන, නැගෙනහිරට : කොහුණුකුඹුර, දකුණට : ආන්දයමේ වැව, බස්නාහිරට : පිටවිල නොහොත් ඕකේඅත්තවිල යන මායිම් තුළ වී අමුණක් වපසරිය ඇති අඹගහකුඹුරෙන් නොබෙදූ 12/20 පංගුව මාතර, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 506/56 යටතේ ලියාපදිංචිකර තිබේ.

3. එම්ගම ගොරකහදෙනිය නමැති කුඹුරට මායිම්—උතුරට : කැටකාලගහ වත්ත නොහොත් කන්ඩම්බියා වත්ත, නැගෙනහිරට : උඹරාගස්දෙනිය, දකුණට : කීනගහ වත්ත නොහොත් කන්ඩම්බියා වත්ත, බස්නාහිරට : කන්ඩම්බියා වත්ත යන මායිම් තුළ පිහිටි වී පැලක් වපසරිය ඇති කුඹුරෙන් නොබෙදූ 11/50 පංගුව වේ.

4. එම්ගම දෙලගාව වත්ත නමැති ඉඩමට මායිම්—උතුරට : වට්ටක්කොඩහේන නොහොත් කුරුඳුහේන, නැගෙනහිරට : කන්ඩම්බියා වත්ත, දකුණට : ගොන්තිප්පල නොහොත් උස්ගොඩහේන, බස්නාහිරට : පොතුකුඹුරේගොඩ හේන නොහොත් කුරුඳුහේන අගල සහ ඉහලදෙනිය යන මායිම් තුළ පිහිටි අක්කර 2½ ක් පමණ විශාල ඉඩමේ සියලු පළතුරුවලින් හා බිමෙන් නොබෙදූ 61/100 පංගුව මාතර, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 378/11 යටතේ ලියාපදිංචි කර තිබේ.

මැ. ග. වින්සන්ට්,
අතිරේක නියෝජ්‍ය පිස්කල්.
මාතර නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1969 ක්වූ අගෝස්තු මස 1 වැනි දින,
මාතර, පිස්කල් කන්තෝරුවේ දීය.

8—828

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**1968 දෙසැම්බර් මස 20 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

## ඌව පළාත

### බදුල්ලේ ඉල්ලීම් උසාවියේදීය

ආර්. ඇම්. බණ්ඩා, මැදගෙදර, වටලවෙගම, ගම්පහකෝරලේ, ................................................... පැමිණිලිකාරයා.

අංක 17,580 එදිරිව

ආර්. ආර්. ඇම්. අප්පුහාමි, වටලශ්විගම, මස්පැන්න ................................................... විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන්දේ පලුවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 22 දින පෙරවරු 11 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් රු. 1,500 ක් ද 25. 9. 66 සිට මුදල ගෙවන තුරු නීති පොළියද ගාස්තුව රු. 200.75 ක් හා සෑම රු. 5 කට හා ඉන් කොටසකට ශත 10 බැගින්වූ පවුන්ඩේජ් මුදලක්ද අය කරගැණීම සඳහා :

1. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ ගම්පහ කෝරලේ වැටලේගම පිහිටි උතුරට : ගම්සභා පාර හා ඇලද, නැගෙනහිරට : එච්. ඇම්. පුංචිරාලගේ කුඹුරේ ඉම නියරද, දකුණට : ඩබ්ලිව්. ඇම්. අප්පුහාමිගේ කුඹුරේ ඉමනියරද, බටහිරට හෙවලිය හා ගම්සභා පාරද වශයෙන් මායිම්ව ඇති හෙලවටලාවේ කුඹුර නමැති වී කුරුණී පහක පමණ වපසරිය ඇති කුඹුර. මෙය බදුල්ලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී/344/117 වශයෙන් ලියාපදිංචිවී ඇත.

2. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ රිටිකුඹුරේගම පිහිටි උතුරට හා නැගෙනහිරට : කඳුරද, දකුණට : කඳුවැටිය, බටහිරට : ඇලද වශයෙන් මායිම්ව ඇති කදිර අරුව අංක 44 දරණ අමුණකුත් පැල් දෙකක් පමණ වපසරිය ඇති කුඹුරේ නොබෙදූ 6/24 කොටසක් : මෙය බදුල්ලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී. 320/276 වශයෙන් ලේඛනගතව ඇත.

3. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ කොහිලේගම පිහිටි උතුරට : ඇල හෙවලිය, නැගෙනහිරට : වේල්ල හා ඇල, දකුණට : වෙල්වැටියද, බටහිරට : ඇල හා ගල්වැටද වශයෙන් මායිම්ව ඇති පැල් 7, කුරුණී 5 ක් පමණ වපසරිය ඇති උඩුතුරේ කුඹුර නමැති කුඹුරෙන් නොබෙදූ 1/6 කොටසක් : මෙය බදුල්ලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී/263/169 වශයෙන් ලියාපදිංචි වී ඇත.

අ. තෙ. සිවලිංගම්,
ඌව පළාතේ පිස්කල් වෙනුවට.

1969 අගෝස්තු මස 1 දින,
බදුල්ලේ පිස්කල් කාර්යාලයේදීය.

8—841

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

උපලේඛනය

**1969**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 69. 6. 6 සිකුරාද | ... | 69. 5.30 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.13 සිකුරාද | ... | 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.20 සිකුරාද | ... | 69. 6.13 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.27 සිකුරාද | ... | 69. 6.20 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | ... | 69. 7. 4 සිකුරාද | ... | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.11 සිකුරාද | ... | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.18 සිකුරාද | ... | 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.25 සිකුරාද | ... | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | ... | 69. 8. 1 සිකුරාද | ... | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8. 8 සිකුරාද | ... | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.15 සිකුරාද | ... | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.22 සිකුරාද | ... | 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.29 සිකුරාද | ... | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 69. 9. 5 සිකුරාද | ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 සිකුරාද | ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.19 සිකුරාද | ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 සිකුරාද | ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 සිකුරාද | ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 සිකුරාද | ... | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 සිකුරාද | ... | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 සිකුරාද | ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 සිකුරාද | ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 සිකුරාද | ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 සිකුරාද | ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයකි